**කළුගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1) - 2021**

---

කළුගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1) හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2017 ජුලි 07 දින එළඹි අංක එස්.එල්-පී 117 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 19 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කළුගඟ ජලය සම්පාදන පහසුකම් පුළුල් කිරීම සහ ජලය බෙදා හැරීමේ ජාල ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් බස්නාහිර පළාතේ දකුණු ප්‍රදේශයේ ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, එමඟින් එහි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායක වීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 55, 337 කට සමාන ජපාන යෙන් මිලියන 39,069 ක් සහ ඉන් රුපියල් මිලියන 45, 056 ට සමාන ජපන් යෙන් මිලියන 31,810 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය යටතේ වූ ක්‍රියාකාරකම් 2018 මැයි 01 දින ආරම්භ කර තිබූ අතර 2023 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3** මතය

------

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශයන් මඟින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | රුපියල් මිලියන 1.86 ක් වූ අත්තිකාරම් ගෙවීම් ආපසු අයකර ගැනීම, ගෙවිය යුතු ගිණුමෙන් අඩු කිරීම වෙනුවට ණය මුදලින් අඩු කර තිබුණි. | 1.86 | අත්තිකාරම් ගෙවීම උපදේශන සේවා කොන්ත්‍රාත්තුව සඳහා වෙන් කර ඇති JICA ණය අරමුදල් හරහා ගෙවා ඇත.<br>එබැවින්**,** අත්තිකාරම් ගෙවීම ආපසු අයකර ගැනීම සමාන වාරික **45** කින් **(**වටිනාකම රු**.** මිලියන **1.86)** සිදු කරනු ලබන අතර**,** සහ එය ණය මුදලෙන් වියපැහැදම් කරනු ලබන අතුරු බිල්පත් වලින් අඩු කරනු ලැබේ. | අඩුපාඩුව නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දින දක්වා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වියපැහැදම් වාර්ථා වලට අනුව, ණය මුදලෙන් සත්‍ය ලෙස උපයෝජනය කරන ලද මුදල රුපියල් මිලියන 451.74 ක් වූ නමුත් එය මූල්‍ය ප්‍රකාශනවල රුපියල් මිලියන 449.88 ක් ලෙස දක්වා තිබුණි. වෙනස වූ රු. මිලියන 1.86 ක් ගළපා නොතිබුණි. | 1.86 | පිළිතුරු දුන්නේ නැත | ණය මුදල වියපැහැදම් කිරීම සැසඳීම සහ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති රීති සහ රෙගුලාසි වෙත යොමු කිරීම | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ණය ගිවිසුමේ III පරිච්ජේදයේ 4 (3) වගන්තියට අනුව, ණය ගැනුම්කරු, එම ණය මුදලින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට (උප ණය) ණයක් ලබා දිය හැකිය. | 2021 දෙසැම්බර් 31 දක්වා ණය ගැනුම්කරු සහ NWSDB අතර උප ණය ගිවිසුම අත්සන් කර නොතිබුණි. | මෙම කාරණය ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ හෝ NWSDB හි පාලනයෙන් ඔබ්බට ය. | භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | මුදල් රෙගුලාසි 626 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන වෙනම ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් සහ මුදල් පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පිළිතුරු දුන්නේ නැත | ව්‍යාපෘතිය සඳහා වෙනම ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1. භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් පැකේජයන් දහයකින් සහ උපදේශන සේවා කොන්ත්‍රාත්තුවකින් සමන්විත වේ. කොන්ත්‍රාත්තු දහයෙන්, ව්‍යාපෘතිය - 1 ට අදාල කොන්ත්‍රාත්තු 5 හි සවිස්තරාත්මක සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු සහ ව්‍යාපෘතිය - 2 ට අදාල ඉතිරි කොන්ත්‍රාත් පැකේජයන් 5 හි සවිස්තරාත්මක සැලසුම් කිරීමේ කටයුතු පමණක් ව්‍යාපෘතිය යටතේ නිම කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, උපදේශන කොන්ත්‍රාත්තුව පමණක් ප්‍රදානය කොට ඇති අතර සවිස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහාය දීමේ කටයුතු පමණක් ආරම්භ කොට තිබුණි. එබැවින්, 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ කිසිදු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි. ඒ අනුව, ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම්කරණයේ ප්‍රගතිය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සහාය කටයුතු පහත පරිදි වේ.

| අංකය | ව්‍යාපෘති සංරචකය / කොන්ත්‍රාත්තුව | 2021 දෙසැම්බර් 31 දිනට නියමිත ක්‍රියාකාරකම් | නියමිත කාල පරිච්ඡේදය | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | ප්‍රමාදය /විගණන නිරීක්ෂණයන් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| (අ) | උපදේශන සේවා කොන්ත්‍රාත්තුව | ව්‍යාපෘතිය - 1 සහ ව්‍යාපෘතිය -2 සඳහා සවිස්තරාත්මක සැලසුම්කරණය. | 2022 පෙබරවාරි 28 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත | කොන්ත්‍රාත් පැකේජ 1, 3 සහ 5 හි සැලසුම් කටයුතු 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය - 2 හි නිම කර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය - 2 අදාළව 6 සිට 10 දක්වා වූ කොන්ත්‍රාත් පැකේජවල සැලකිය යුතු සැලසුම් ප්‍රගතියක් 2021 දෙසැම්බර් 31 වන විට දක්නට නොතිබුණි. | කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාද වීමට ඉඩ ඇත | ක්‍රියාත්මක කිරීමේ කාලසටහන මාස 12 කි. කෙසේ වෙතත්, වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ දැඩි පසුබෑම් ප්‍රතික්ෂේප කරමින්, ඉහත පැකේජ 2 හි සවිස්තරාත්මක සැලසුම් අපි මාස 6 කින් (2022 ජුනි මාසයේදී) සම්පූර්ණ කර ඇත. | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | ජල තුළුමුව පහසුකම සහ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම, - පැකේජය | ලංසු ලේඛනය සඳහා JICA එකඟතාව ලබා | 2021 නොවැම්බර් සිට | සැලසුම් කටයුතු සිදු වෙමින් පවතින බැවින් ලංසු ලේඛනය සකස් කර | නියමිත කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව | ක්‍රියාත්මක කිරීමේ කාලසටහනේ දක්වා ඇති සැලසුම් කාලය මාස 12ක් | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 01 | ගැනීම | දෙසැම්බර් දක්වා | නොතිබුණි | ප්‍රදානය කිරීම ප්‍රමාද වීමේ හැකියාවක් තිබීම. | බව කරුණාවෙන් සලකන්න. කෙසේ වෙතත්, සැලසුම් ප්‍රගතියට මුලින්ම COVID-19 වසංගතය බලපෑ අතර විෂය පථයේ සිදුවූ වෙනස්කම් වල බලපෑමද හේතුවිය. (මුලින් යෝජිත රොන් මඩ පිරියම් කිරීමේ ක්‍රමය ‘Filter press’ සිට ‘Sludge Centrifuges’ ලෙස වෙනස් වූ අතර ඒ අනුව සැලසුම් කටයුතුද වෙනස් කළ බව අවධාරණය කළ යුතුය.) | |
| (ඈ) | සම්ප්‍රේෂණ ජාලයන් සහ බෙදාහැරීමේ ජාලයන් සැපයීම සහ ඇතිරීම - පැකේජය 02 | ලංසු කැඳවීම සහ වසා දැමීම | 2021 ඔක්තෝබර් සිට 2022 ජනවාරි දක්වා | සැලසුම් කටයුතු අවසන් කර ඇත. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි | නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය ප්‍රමාද වීමට ඇති හැකියාව | කොන්ත්‍රාත් පැකේජය -2 හි සවිස්තරාත්මක සැලසුම් කටයුතු නියමිත සැලසුම් කාලසීමාවට පෙර නිම කරන ලදී. ඒ නිසා එලෙස ප්‍රමාදයක් නොමැත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | භූගත ජලාශ සහ පොම්පාගාර ඉදිකිරීම - පැකේජය 03 | ලංසු ලේඛනය සඳහා JICA එකඟතාව ලබා ගැනීම. | 2021 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා | පැකේජය 03 සැලසුම් අදියරෙහි පවතින බැවින් ලංසු ලේඛනය සකස් කර නොතිබුණි | නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය ප්‍රමාද වීමට ඇති හැකියාව | ක්‍රියාත්මක කිරීමේ කාලසටහන මාස 12 කි. අසම්පූර්ණ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය හේතුවෙන් එක් භූගත ජලාශ පරිශ්‍රයකට (දෙල්කඳ ඉඩම) පරීක්ෂණ/නිරීක්ෂණ කටයුතු සඳහා ප්‍රවේශ විය නොහැකි | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | වූ බැවින් විස්තරාත්මක සැලසුම් ප්‍රගතියට බාධා එල්ල වූ බව අවධාරණය කළ යුතුය. එහෙයින් නොවැළැක්විය හැකි ප්‍රමාදයක් ඇති වීමට ඉඩ තිබුණි. | |
| (ඉ) | බෙදාහැරීමේ ප්‍රධාන ජාලයන්හි සහ ද්විතියික ජාලයන්හි ඉතිරි කොටස් සැපයීම සහ ඇතිරීම ඇතුළු DMA උපකරණ සැපයීම සහ සවිකිරීම - පැකේජය 05 | ටෙන්ඩර් සහ කොන්ත්‍රාත් අංශය වෙත ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු ඇගයීම සඳහා TEC පත් කිරීම. | 2021 දෙසැම්බර් සිට 2022 ජනවාරි පළමු සතිය දක්වා | පැකේජය 05 සැලසුම් අදියරේ පවතින බැවින් ලංසු කැඳවීම ආරම්භ කර නොතිබුණි | නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීමට ඇති හැකියාව | ක්‍රියාත්මක කිරීමේ කාලසටහන මාස 12 කි. ප්‍රධාන වශයෙන් මෙම පැකේජයේ නැවත සංශෝධනය වූ විෂය පථයේ වූ සංකීර්ණත්වය හේතුවෙන් මෙහි සවිස්තරාත්මක සැලසුම් තවමත් කරගෙන යන බව අවධාරණය කල යුතුය. | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|
| ව්‍යාපෘතියේ සැලසුම් අදියර සඳහා අවශ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 24 කි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දින වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දී ඇත්තේ කාර්ය මණ්ඩලය 9 දෙනෙකු සඳහා පමණි. ඒ අනුව, සැලසුම් අදියර සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා 15 ක් අවශ්‍ය වන අතර වහාම ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීම සඳහා ව්‍යාපෘතියට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | විස්තරාත්මක සැලසුම් අදියර සඳහා අවශ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 24 ක් වන අතර එම නිසා ඉතිරි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සියලු පියවර ගනු ලැබේ. නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මන්දගාමී ප්‍රතිචාරයක් දක්නට ලැබේ. | ව්‍යාපෘති කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 පද්ධතිය සහ පාලන

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 626 ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් සහ මුදල් පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පිළිතුරු දී නැත | ව්‍යාපෘතිය සඳහා වෙනම ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය |
| (ආ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දින චක්‍රලේඛ අංක 05 මගින් නියම කර ඇති පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් වී නොතිබුණි. | පිළිතුරු දී නැත | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. |